# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
පොලිස් මූලස්ථානය, කොළඹ 01

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | | | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1506 / 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி | දිනය<br>Date | 03/12/2023<br>පැය 0745 |

## මාධ්‍ය නිවේදනය

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

### 01. දියේ ගිලී පුද්ගලයෙකු මියයාම - අළුත්ගම පොලිස් වසම.

2023.12.02 වන දින දහවල් කාලයේ අළුත්ගම පොලිස් වසමේ මොරගල්ල වෙරළ තීරයේ දිය නාමින් සිටියදී විදේශ ජාතිකයෙකු දියේ ගිලී මියගොස් ඇති බවට අළුත්ගම පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 71 ක් වූ පෝලන්ත ජාතිකයෙකු වේ.**

මරණකරු තම බිරිඳ සමඟ වෙරළ තීරයට පැමිණ දිය නාමින් සිටියදී මෙම අනතුරට ලක්ව ඇති අතර ප්‍රදේශවාසීන් විසින් මෙම පුද්ගලයා බේරාගෙන බේරුවල රෝහලට ඇතුලත් කිරීමෙන් අනතුරුව මියගොස් ඇත. පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා මෘත ශරීරය බේරුවල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අළුත්ගම පොලීසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 02. මාරක රිය අනතුරක් - ගම්පහ පොලිස් වසම.

2023.12.02 වන දින උදෑසන කාලයේ ගම්පහ පොලිස් වසමේ ගම්පහ ජාඇල මාර්ගයේ මාබිම ප්‍රදේශයේදී ගම්පහ දෙස සිට ජාඇල දෙසට ගමන් කළ යතුරුපැදියක් මාර්ගයේ ගමන් කළ පදිකයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදිකයා හා යතුරුපැදිකරු ගම්පහ රෝහලට ඇතුලත් කිරීමේදී පදිකයා මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 69 ක් වූ වැලිගම්පිටිය, ජාඇල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ගම්පහ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ගම්පහ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 03. මාරක රිය අනතුරක් - ඌව පරණගම පොලිස් වසම.

2023.12.02 වන දින සවස් කාලයේ ඌව පරණගම පොලිස් වසමේ වැලිමඩ මස්පන්න මාර්ගයේ දඹුලන්කඳුර ප්‍රදේශයේදී වැලිමඩ දෙස සිට මස්පන්න දෙසට ධාවනය වූ ලොරි රථයක් වේගය පාලනය කරගැනීමට නොහැකිව ප්‍රපාතයකට පෙරළී ගොස් ගසක ගැටී අනතුරට ලක්ව ඇත. අනතුරින් ලොරි රථයේ රියදුරු හා පුද්ගලයින් දෙදෙනෙකු බරපතල තුවාල ලබා ඌව පරණගම රෝහලට ඇතුලත් කිරීමේදී රියදුරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 46 ක් වූ අයිවල, බිබිල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ඌව පරණගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ඌව පරණගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**